**මහවැලි ජල ආරක්ෂණ ආයෝජන වැඩසටහන - අදියර 02 - 2018**

-------------------------------------------------------------------------------

මහවැලි ජල ආරක්ෂණ ආයෝජන වැඩසටහන - අදියර 02 හි 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු ණය ගිවිසුම් අංක 3625 – (එස්ආර්අයි) හි 4.02(අ) වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 මැයි 18 වන දින එළඹි ණය ගිවිසුම් අංක 3626 – (සීඕඑල්) හි 04.02(අ) වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව**

**-------------------------------------------------------------------------------------------**

වැඩසටහනේ ණය ගිවිසුම අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. වැඩසටහන ක්‍රියාත්මක කරන ප්‍රදේශයෙහි කෘෂිකාර්මික හා පානීය ජල අවශ්‍යතා සඳහා ජලය ලබා ගැනීමේ හැකියාව තහවුරු කිරීමේ වැඩසටහනෙහි අරමුණු වේ. ණය ගිවිසුම අනුව, වැඩසටහනෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 43,734 කට සමාන එ.ජ.ඩො. මිලියන 242 ක් වූ අතර, ඉන් රු.මිලියන 37,951කට සමාන එ.ජ.ඩො. මිලියන 210 ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යායනය කිරීමට එකඟත්වය පළ කර ඇත. රු. මිලියන 5,783 ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යායනය කිරීමට අපේක්ෂා කර ඇත. මෙම වැඩසටහනෙහි කටයුතු 2018 ජුලි 23 වන දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එය අවසන් කිරීමට නියමිතව ඇත.

**1.3 මතය**

**------**

වැඩසටහනෙහි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

**---------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑමට නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශචිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණ සඳහා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | | බලපෑම | කළමණාකාරීත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිරිදේශ |
|---|---|---|---|---|
| (අ) | ලැබී ඇති තොරතුරු වලට අනුව, මොරගහකන්ද කළුගඟ හුවමාරු ඇළෙහි කිලෝමීටර් 8.83 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 8,218.06 ක ඇස්තමේන්තුගත පිරිවැයකට, 2018 මැයි 04 වන දින විදේශීය සමාගමක් වෙත පිරිනමා තිබුණි. රු.මිලියන 1,074.24 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් නිදහස් කර තිබුණද, 2018 සැප්තැම්බර් 17 දින කොන්ත්‍රාත්කරු විසින් වැඩ ආරම්භකර තිබුණි. | අත්තිකාරම් දෝෂ සහගත ලෙස යෙදවීමේ හැකියාව පවතී. | අදහස් දැක්වීම් ඉදිරිපත්කර නොමැත. | ඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අනපේක්ෂිත ප්‍රමාදයන් අවම කිරීමට කටයුතු කරනු ඇත. |
| (ආ) | තවද, ඉහත දක්වන ලද ඉදිකිරීම් වැඩ වල පරිසර කළමණාකරණ සැලැස්ම, සෞඛ්‍ය හා ආරක්ෂණ සැලැස්ම, විස්තරාත්මක වැඩ සැලැස්ම හා ඉදිකිරීම් සිතියම් ආදිය 2018 දෙසැම්බර් 31 දින දක්වා ම ඉදිරිපත්කර නොතිබුණි. | වැඩසටහන් කටයුතු ක්‍රියාත්මක කිරීමේදී සැළකිය යුතු ප්‍රමාදයන් ඇති වීම. | රක්ෂණ ආවරණය, පරිසර කළමනාකරණ සැලැස්ම, සෞඛ්‍ය හා ආරක්ෂණ සැලැස්ම හා ඉදිකිරීම් සිතියම් ආදිය මේ වන විට ඉදිරිපත් කර ඇත. | |
| (ඇ) | ඉහළ අළුහැර ඇළෙහි කිලෝමීටර් 28 ක කොටස ඉදිකිරීමේ හා වයඹ ඇළෙහි මහකිතුළ උමං මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු 2018 දෙසැම්බර් 31 දිනටද පිරිනමා නොතිබුණි. | වැඩසටහනෙහි අපේක්ෂිත ප්‍රතිලාභ කාලීන වශයෙන් පොදු මහජනතාව වෙත ලබා නොවෙනු ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාලිය යෙදවීමේදී ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන්, නියමිත කාලයට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට නොහැකි විය. | -එම - |